**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) | 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත | | | |
| (i) | IV වන කොටසේ 12 (1) උප වගන්තිය | අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලයකට පැවරිය යුතු වුවද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනට කළමනාකරණ මණ්ඩලයක් පත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වගකීම භාර ගැනීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පැවතුණි. | 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් සඳහා වන වගකීම අධිකාරියෙහි කළමණාකරණ මණ්ඩලය වෙත පැවරී තිබුණ ද, 2019.11.28 දින ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද PS/SP/SB/Circular/02/2019 චක්‍රලේඛ ප්‍රකාරව කළමණාකරණ මණ්ඩලය ඉවත් වූ අතර මේ දක්වාද පත් කර නොමැත. මූල්‍ය ප්‍රකාශන වල වගකීම භාර ගැනීම අධිකාරියෙහි ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වන අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් මඟින් සිදුකරන ලදී. | කළමනාකරණ මණ්ඩලය කඩිනමින් පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** | 29 (5) වගන්තිය | අධිකාරිය සතුව ආරක්ෂන අරමුදලක් තිබිය යුතු අතර, අරමුදලේ ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳ නිසි ගිණුම් තැබිය යුතු වුවත් ආරක්ෂන අරමුදලේ වත්කම් හා බැරකම් අධිකාරියේ ශේෂ පත්‍රයට ඇතුලත් කර දක්වා තිබුණි. | අධිකාරියෙහි ආරක්ෂණ අරමුදලෙහි ආදායම් සහ වියදම් ප්‍රකාශය වෙනමම ඉදිරිපත් කර ඇත. ආරක්ෂණ අරමුදලින් මේ දක්වා කිසිදු වත්කමකට හෝ වගකීමකට අදාල ගනුදෙනු සිදු වී නැත. ඒ අනුව අධිකාරියේ ආරක්ෂණ අරමුදල සටහන් අංක 16 මගින් ශේෂ පත්‍රයෙහි හිමිකමක් ලෙස වෙනමම පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේදී ආරක්ෂණ අරමුදල සම්බන්ධයෙන්, වත්කම් බැරකම් වලට අදාල ගනුදෙනු සිදුවන්නේ නම් ආරක්ෂණ අරමුදල සඳහා වෙනම ශේෂ පත්‍රයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 543, 765 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 487,801 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු. 55,964 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැනුවත් කිරීමේ වැඩ සටහන් තරගකාරී මිළගණන් කැඳවීමකින් තොරව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 19/2019 මගින් තීරණය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් එහි පවත්වා තිබූ අතර පලමුව මිලගණන් කැඳවූ අවස්ථාවේ දී අඩුම මිළගණන් ඉදිරිපත් කර තිබූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) පැවැත්වූයේ නම් අධිකාරියට රු. 3,094,569 ක මුදලක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීමේදී බොහෝ අවස්ථාවල රාජ්‍ය ආයතන තුනකින් මිළ ගණන් කැඳවන ලද අතර වැඩසටහන් පැවැත්වීමේ ප්‍රයෝගිකව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වූ අවස්ථා බහුලය. එහෙත් BMICH හි වැඩසටහන් පැවැත්වීමේදී එවැනි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු නොවේ. මෙම තත්ත්වය පදනම් කර ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 2019/19 මගින් | ප්‍රසම්පාදන අරමුණු වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ජාතික අධිකාරිය මගින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් BMICH හි පැවැත්වීමට අනුමැතිය ලැබී ඇත. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා පදනම්ව සැලසුම්ගත කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ගැනීම කලයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ඉතිරි වූ රු. මිලියන 17 ක මුදලක් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි. | සමාලෝචිත වර්ෂයෙහි අපේක්ෂිත පරිදි කුලී පදනම මත වෙනත් ගොඩනැගිල්ලක් ලබා ගැනීමට සිදු නොවීම හේතුවෙන් රැකවරණ නිලධාරීන් බඳවා ගැනීම සිදු නොකිරීමත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අධ්‍යක්ෂ (රැකවරණ), අධ්‍යක්ෂ (සහාය) තනතුරට අදාල බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය නොලැබීමත් හේතුවෙන් පුනරාවර්තන ප්‍රතිපාදන වලින් රු.17,000,000.00 ක් කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව නැවත රේඛීය අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කරන ලදි. | තාත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| **(ආ)** | අවස්ථා 26 ක දී ලබා දුන් අත්තිකාරම් මුදල් රු. 785,675 ක් හා වියදම රු. 414,894 ක් වූයෙන් රු. 370,781 ක් ප්‍රමාණය ඉක්මවා ලබා දී තිබුණි. එය සියයට 25 සිට සියයට 100 ක පරාසයක විය. | වැඩසටහන් සඳහා සහභාගී කරවීමට බලාපොරොත්තු වන ප්‍රමාණය අනුව අත්තිකාරම් ලබා ගත්ත ද 100% ක් සහභාගී නොවීම මත ලබාගත් අත්තිකාරම් මුදල් ඉතිරි වේ. සිදුවූ අතපසුවීම් හඳුනාගත් අතර ඉදිරි අවස්ථාවන් වලදී මෙම අතපසුවීම් අවම කර ගැනීමට කටයුතු කරනු ඇත. | ඇස්තමේන්තු මත පදනම්ව අදාල කාර්යයට ප්‍රමාණවත් මුදලක් පමණක් අත්තිකාරම් ලෙස ලබා දිය යුතු වීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016, 2017, 2018 හා 2019 වර්ෂවලදී අධිකාරියට ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 12, 49, 86 හා 252 ක් ලෙස එකතුව 399 ක් විය. වසර හතර තුල අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 153 ක් වූ අතර එය පිළිවෙලින් 8,37,47 හා 61 ක් විය. එය ලද පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සියයට 66, 75, 55 හා 24 ක් විය. අධිකාරිය විසින් මෙතෙක් ආරක්ෂක අංශය හෝ සහායක අංශය ස්ථාපිත කර නොමැති හෙයින් සහාය ඉල්ලා කරන ලද ඉල්ලීම් 16 ක කටයුතු නීති අංශය විසින් සිදු කර තිබූ අතර ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂක කොට්ඨාසය වෙත පැමිණිලි 81 ක් යොමු කර තිබුණි. | 2019 වර්ෂය අවසාන වන විට අධිකාරියට ලැබුණු සියළු පැමිණිලි අතුරින් 153 ක් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.<br>එමෙන්ම පොලිස් ස්ථානවලින් නීති උපදෙස් ඉල්ලා ඇති අවස්ථා 22 කදී අධිකාරිය විසින් උපදෙස් ලබාදී ඇති අතර 24 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කර ඇති නියෝග 14 කට අදාල ආරක්ෂාව සැපයීම්ද අධිකාරියේ මැදිහත් වීම යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයේ සහාය ඇතිව සිදු කරනු ලැබේ.<br>ඒ අනුව බොහෝ පැමිණිලි ඒවාට අදාල අධිකරණ කටයුතු අවසන් වන තුරු විවෘතව තබා ගැනීමට අධිකාරියට සිදුවන බව දන්වා සිටිමි. | අධිකාරියේ ආරක්ෂක අංශය හා සහය අංශය කඩිනමින් ස්ථාපිත කළ යුතු වීම. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) උප වගන්තිය ප්‍රකාරව විද්‍යුත් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබෙන බව දක්වා තිබුණත්, රු.183,015 ක මිලදී ගැනීමක් සඳහා පෞද්ගලික පොත්හලකින් 2018 ඔක්තෝබර් 10 දින සහ අවස්ථා 06 කදී එකතුව රු. 4,704,819 කට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) විද්‍යුත් තැපැල් (Gmail) මඟින් ඉදිරිපත් කළ මිළ ගණන් පිළිගෙන තිබුණි. | අතපසුවීම් පිළිබඳව අවධානය යොමු කර මින් ඉදිරියට එවැන්නක් සිදු නොවීමට කටයුතු කරනු ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 55 ක් වූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය සංඛ්‍යාව 38 ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණි. | අධ්‍යක්ෂ පුරප්පාඩු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. විමර්ශන නිලධාරී පුරප්පාඩු 01 ක් පවතී. රැකවරණ නිලධාරීන් අධ්‍යක්ෂවරුන්ගේ සුපරීක්ෂණය යටතේ වන බැවින් එම තනතුරු සම්පූර්ණ කරන තෙක් රැකවරණ නිලධාරීන් බඳවාගත නොහැක. සන්නිවේදන නිලධාරී පුරප්පාඩුව 2019.11.20 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව නැවත සමලෝචනය කර දැනුම් දෙන තෙක් බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවිනි. | මෙම තනතුරු වල පුරප්පාඩු පැවතීම ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සෘජුවම බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |